# සිකුරාදා

පළමුවන කියැවීම රෝම 15: 14-21

ශුද්ධ වූ පාවුළු තුමන් විසින් රෝමවරුන් වෙත යවන ලද හසුනෙන් කොටසකි.

විජාතීන් උදෙසා ජේසුස් වහන්සේගේ සේවකයකු වීමට නම් දෙවියන් වහන්සේ මා පත් කළ සේක.

සහෝදරයෙනි, ඔබ යහපත්කමින් පිරුණාවූ ද, ප්‍රඥා සම්පන්න වූ ද එකිනෙකාට අවවාදානුශාසනා දීමෙහි පොහොසත් අය බව ද මම ඒකාන්තයෙන් දනිමි. එහෙත් ඔබට ඇතැම් කරුණු සිහිකර දීමක් වශයෙන් මේ හසුනේ සමහර තැන්වල නිර්භීත ලෙස ඔබ වෙත ලියා ඇත. එසේ ලියන්නේ, විජාතීන් උදෙසා ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සේවකයකු වීමට දෙවියන් වහන්සේ මට දෙවා වදාළ වරප්‍රසාදය නිසා ය. ඒ පූජක සේවය, විජාතීන් ශුද්ධාත්මයාණන් විසින් කැප කරනු ලැබ, දෙවියන් වහන්සේට ප්‍රිය මනාප පූජාවක් වන අයුරින් සුබ අස්න දේශනා කිරීම ය. ක්‍රිස්තුස් ජේසුස් වහන්සේට අයත් කෙනෙකු ලෙස දේව සේවාව ගැන මම ද උදන් අනමි. වචනයෙන් හා ක්‍රියාවෙන් ද හාස්කම්වල හා අරුමපුදුමවල අනුහසින් ද ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් ද විජාතීන් තමන් වහන්සේට පක්ෂපාත කරවන ලෙස ක්‍රිස්තුස් වහන්සේ මා ලවා කළ අරුම පුදුම දේ ද ලකුණු ද ගැන මිස අන් කිසිවක් ගැන කතා කිරීමට මම ධෛර්යයවත් නොවෙමි. මෙසේ මම ජෙරුසලමේ සිට ඉල්ලූරිකය දක්වා ක්‍රිස්තුස් වහන්සේගේ සුබ අස්න දේශනා කොට නිම කළෙමි. හැම විට ම මාගේ පරමාර්ථය වූයේ, අන් කෙනෙකු දැමූ පදනමක් පිට ගොඩනැගීමෙන් වැළකෙන පිණිස, කවරදා වත් ක්‍රිස්තුස් වහන්සේගේ නාමය සඳහන් නොවූ තැන්වල සුබ අස්න දේශනා කිරීම ය. මන්ද, “උන් වහන්සේ ගැන ආරංචියක් නොලත් අය උන් වහන්සේ දකිති. උන් වහන්සේ ගැන නෑසූ අය උන් වහන්සේ තේරුම් ගනිති” යි ශුද්ධ ලියවිල්ලෙහි ලියා ඇත.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 98: 1-4

පිළිතුර : සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කරන සේක.

ගීය : සමිඳුන්ට නව ගීයක් ගයන්න.
මන්ද,එතුමාණෝ අසිරිමත් ක්‍රියා කළ සේක.
සිය බලයෙන් හා ශුද්ධ ශක්තියෙන් ජයග්‍රහණය ලත් සේක.
සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක.

විජාතීන්ගේ ඇස් හමුයෙහි සිය විමුක්ති බලය එළිදරව් කළ සේක.
එතුමාණෝ ඉශ්රායෙල් වංශය කෙරෙහි එතුමන්ගේ ප්‍රේමයත්
විශ්වාසවන්තකමත් සිහි කළ සේක.

මිහිපිට සියළු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝ ය.
එම්බා ලෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ප්‍රීතියෙන් ගී ගයන්න.
ප්‍රීති ගී ගයමින් එතුමන් පසසන්න.

සුපුවත් ජය නද 2 කොරින්ති 5: 10

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන ලෝකය
තමන් වහන්සේට සමගි කර ගනිමින්,
ඒ සමගි කිරීමේ සේවය අපට බාර දුන් සේක.
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද 1 ජුවාම් 2: 5

ආලේලූයා! ආලේලූයා!
යමෙක් ක්‍රිස්තුස් වහන්සේගේ දහම පිළිපදින්නේ ද,
ඔහු තුළ දෙවියන් වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ වන්නේ ය.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 16: 1-8

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

"ආලෝකයේ පුත්‍රයන්ට වඩා මේ ලෝකයේ පුත්‍රයෝ සිය කටයුතු සම්බන්ධයෙන් නුවණ ඇත්තෝ ය."

ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට මෙසේ වදාළ සේක. "එක් ධනවතෙකුට ගබඩාකාරයෙක් සිටියේ ය. ඒ ගබඩාකාරයා ඔහුගේ වස්තුව නාස්ති කරති යි ඔහුට පැමිණිලි ලැබිණි. එවිට ඔහු ඒ ගබඩාකාරයා කැඳවා, 'ඔබ ගැන මට ආරංචි වන මේ කාරණය කුමක්ද? ඔබේ ගබඩාකාර නිලය පිළිබඳ අය වැය මට භාර දෙන්න. මින්පසු ඔබට ගබඩාකාර නිලය දැරිය නොහැකි ය' යි කීය. ගබඩාකාරයාද, මාගේ ස්වාමියා ගබඩාකාර නිලයෙන් මා අස් කරන්නට යන නිසා මම කුමක් කරම් ද? බිම් කෙටීමට මට ශක්තියක් නැත. හිඟාකෑමට ලජ්ජා වෙමි. ගබඩාකාර නිලයෙන් මා අස් කළ විට මිනිසුන්ගේ ගෙවල ඉඳුම් හිටුම් ලබා ගැනීමට කළ යුතු දේ මම දනිමි යි සිතින් සිතා ගත්තේ ය. මෙසේ ඔහු තම ස්වාමියාගේ ණයකාරයන් එක් එක් කෙනා බැගින් කැඳවා, පළමුවැනියාට කතා කොට 'මාගේ ස්වාමියාට ඔබ කොපමණ ණය දැ' යි ඇසීය. 'තෙල් පීප්ප සියයකැ' යි ඔහු කීවේය. ගබඩාකාරයා කතා කොට, 'ඔබේ බිල ගෙන වහාම හිඳගෙන පණසක් කියා ලියන්නැ' යි ඔහුට කීය. තවත් කෙනෙකුගෙන් 'ඔබ කොපමණ ණය දැ' යි ඇසී ය. 'තිරිඟු බුසල් දහසකැ' යි ඔහු කීය. 'ඔබ බිල ගෙන අටසියයක් කියා ලියන්නැ' යි ඔහුට කීය. ඒ වංචනික ගබඩාකාරයා එතරම් ශූර නුවණින් ක්‍රියා කළ නිසා ඔහුගේ ස්වාමියා ඔහුට ප්‍රශංසා කළේ ය. මන්ද, ආලෝකයේ පුත්‍රයන්ට වඩා මේ ලෝකයේ පුත්‍රයෝ, සිය කටයුතු සම්බන්ධයෙන් ශූර නුවණ ඇත්තෝ ය."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.